# ප්‍රතිසංස්කරණ සඳහා සාමූහිකය
# திருத்தத்திற்கான கூட்டு
# COLLECTIVE FOR REFORMS

2022 සැප්තැම්බර් මස 13

ශ්‍රී ලංකාව එහි පුරවැසියන්ගෙන් බහුතරයකගේ ජීවිතවලට බලපාන්නා වූ පෙර නොවූ විරූ දරුණු ආර්ථික අර්බුධයක් මධ්‍යයේ සිටිනු ලැබේ. මෙය වහා අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතාවයක් වන බැවින් පීඩාවට පත් අපගේ ජනතාව සඳහා අන්තර්කාලීන හා දිගුකාලීන වශයෙන් සහන ලබාදීම සඳහා කඩිනම් පියවර ගත යුතුව ඇත. බලයේ සිටින ආණ්ඩුව රට මුහුණපාමින් සිටින ආර්ථික ගැටළුව බැරෑරුම්ව ආමන්ත්‍රණය කළ යුතු බැව් ප්‍රකාශ කරනු ලැබ ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආනයන පාලනයන්, බදු අයකිරීම්, ණය ප්‍රතිව්‍යුහගත කිරීම ආදී පොරොන්දුවලට අදාළව ක්‍රියාමාර්ග ගෙන ඇති බව පෙනී යනු ලැබූව ද ඒවායින් සමහරක් සම්බන්ධ ක්‍රියාවලීන් නිසි ලෙස සැලසුම් නොකළහොත් විනිවිද භාවයෙන් තොරවනු ඇත. ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන ක්‍රියාමාර්ග ආමන්ත්‍රණය කිරීමට බලය අනිසි ලෙස භාවිත නොකිරීමෙන් සහ වැරදි කළමනාකරණයකින් තොර, දූෂණයෙන් තොර ආණ්ඩුවක් හරහා ජනතා පිළිගැනීමක් ඇති රජයක් තුළින් ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම මූලික වන්නේය.

පසුගිය මාස කිහිපයේ සිදු වූ සිදුවීම්වලින් පෙන්නුම් කරන්නේ 2019 සහ 2020 ජනාධිපතිවරණයේ සහ පාර්ලිමේන්තු මැතිවරණවල ප්‍රබල ජයග්‍රහණ හරහා සුවිශාල ජනවරමක් ලබා ගත්ත ද ඒ සියල්ල අන්තර්දාන වී ජනතාවගේ විශ්වාසය භුක්ති විදීමට නොහැකි පාර්ලිමේන්තුවක් සහ විධායකයක් මේ වන විට රටට ඇති බවය. අද වන විට විධායකය සහ පාර්ලිමේන්තුව සමන්විත වන්නේ සැකසහිත ගනුදෙනු සහ සීරු මාරු දැමීමේ විශ්වාසනීය චෝදනා ලබාගෙන ඇති බව කියන නිශ්චිත ව්‍යවස්ථාපිත නියමයන් පාලනය කිරීම සඳහා (ජනතාවගේ කැමැත්තෙන් තොරව) ව්‍යවස්ථාපිත වරමක් මත පමණක් නැවත පැමිණිය හැකි පුද්ගලයන්යන්ගෙන්ය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර සම්මුතිවාදී සර්ව පාක්ෂික අන්තර්වාර ආණ්ඩුවක් පිහිටුවිය යුතු බවට ජනතාවගේ හඬ නැඟීම ඉතා පහසුවෙන් නොසලකා හැර තිබේ. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ වත්මන් වත්මන් ජනාධිපතිවරයාගෙන් එම නොලසකා හැරීම පැහැදිලිව සහතිකය වනු ලැබේ. බලය අනිසි ලෙස භාවිතා කිරීම, තමන් අහෝසි කිරීමට ප්‍රතිඥා දුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (ඡෂ් ) වැනි කුරිරු නීති භාවිතා කරමින් නීත්‍යානුකූල අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා අනෙක් මූලික අයිතිවාසිකම් සන්නද්ධ බලය හරහා ඒකාධිපති ලෙසින් මර්දනය කරමින් ”ආණ්ඩුව” සුපුරුදු පරිදි සිය කටයුතු කරගෙන යනු ලැබේ.

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 -1 / 11 2 558 574 Fax: (+94) 11 2 558 572

මෑතකදී පත්කරන ලද රාජ්‍ය අමාත්‍යවරුන් තිස්අට දෙනා බොහෝ දුරට සැක සහිත අක්තපත්‍ර ඇති ආර්ථිකයට බරක් වූ පුද්ගලයන් වුවද, ඔවුන් සියලු දෙනාම ආර්ථික දුෂ්කරතා ඇති රටක තම මූලික වැටුප (පමණක්) අත්හරින බවට ප්‍රකාශ කර ඇත. මෙය කිසිසේත් ම පිළිගත නොහැකි දෙයක් වන්නේ ය. අපේක්ෂා කරන ලද්දේ, ඉතා කඩිනමින් හොඳින් අර්ථ දක්වා ඇති අන්තර්කාලීන ආර්ථික පියවර ගත හැකි කිහිප දෙනෙකුගෙන් සමන්විත අන්තර්වාර කැබිනට් මණ්ඩලයක් පිහිටුවීම සහ ඉතා හැකි ඉක්මනින්, මාස 12කට නොඅඩු කාලයක පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම ය.

වත්මන් රජය විසින් ඉදිරිපත් කරන ලද 22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පවා 20 වැනි සංශෝධනය අහෝසි කර 19 වැනි සංශෝධනය ප්‍රගතිශීලී වැඩිදියුණු කිරීම් සමඟ ප්‍රතිෂ්ඨාපනය කරන බවට හිටපු ජනාධිපතිවරයා මෙන්ම වත්මන් ජනාධිපතිවරයා ද දුන් පොරොන්දුව ඉක්මවා ගොස් ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ මෑත කාලීන නිශ්චය කිරීම්වලට අනුව 22 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ මුල් කෙටුම්පතෙන් අපේක්ෂා කළ ආකාරයට වඩා විධායක ජනාධිපතිවරයාගේ බලතල තවදුරටත් ඉහළ නංවා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් ස්වාධීන වැදගත් ආයතන සහ පාලනයේ ක්‍රියාවලීන් සහතික කිරීමට අදහස් කරන අතර එය ස්වාධීන යැයි සැලකිය නොහැකි අතර එය 19 වැනි සංශෝධනයෙන් සපයා ඇති දෙයට වඩා බොහෝ සෙයින් වෙනස් වනු ලබන්නේය.

සමස්ත සමාජ ව්‍යුහයම කපා හරින පවතින දේශපාලන අස්ථාවරත්වය, ආර්ථික ප්‍රකෘතිය සඳහා වන ඕනෑම ප්‍රගතිශීලී පියවරක් අඩපණ කරනු ඇති අතර, දැනට පාලනයේ යෙදී සිටින අයගේ කිසියම් වටිනා ක්‍රියාමාර්ගයක් හෝ එසේ කිරීමට ඇති කැමැත්ත ගැන පුරවැසියන්ට සැකයක් මුදාහැර ඇත. සමස්ත රටම තවදුරටත් පිරිහීම වැලැක්වීමට නම් කුඩා තේරීමක් ඇති බව පෙනේ. වසර 74ක ජරාජීර්ණ වූ බෙදුම්වාදී, සූරාකෑමේ සංස්කෘතිය නිශ්චිතවම ජයගෙන රට නිසි ගමනක් යාමට ක්‍රමයේ වෙනසක් ගෙන ඒමට අවශ්‍ය නම් පාර්ලිමේන්තු මැතිවරණය සහ ජනමත විචාරණයකින් වුව ව්‍යවස්ථා සංශෝධනයක් කිරීම දැනට ඇති එකම විකල්පය බව පෙනී යනු ලැබේ.

වත්මන් ජනාධිපතිවරයා දූෂණයෙන් යටිබිම්ගතව ඇති සියලු පීඩාකාරී ක්‍රියාවලින් සහ ආර්ථික නාස්තියෙන් මිදී ජනතාවගේ කැමැත්තට එකඟව කටයුතු කිරීම සහ ස්වාධීන විශේෂඥයින්ගේ මගපෙන්වීම ඇතිව කඩිනමින් ආමන්ත්‍රණය කිරීමට හැකි අවංකභාවයෙන් යුත් ආර්ථික ගැටලු කඩිනමින් විසඳා ගැනීමේ හැකියාව සහිත සීමිත සම්මුතිවාදී කැබිනට් මණ්ඩලයක් පිහිටුවීම මෙම ප්‍රමාදී අවධියේදී පවා අපි අනිවාර්ය දෙයක් ලෙස සලකමු. එවැන්නක් මාස 12 කට නොවැඩි නිශ්චිත කාල රාමුවක් සමඟ කඩිනම් මැතිවරණ සහතික කිරීමක් සහ අවශ්‍ය නම් ව්‍යවස්ථා සංශෝධන සඳහා ජනමත විචාරණයක් හරහා හෝ විධායක ජනාධිපති ධුරය අහෝසි කර සුපිරිසිදු පාලනයක්, නීතියේ ආධිපත්‍යය සහ සැමට සමානාත්මතාවය සඳහා ක්‍රම වෙනසක් ඇති කළ යුතුය.

අත්සන් කරනු ලැබුවේ
ප්‍රතිසංස්කරණ සඳහා වූ සාමූහිකය

13-09-2022

Sri Lanka is in the midst of an unprecedented and severe economic crisis affecting the lives of a majority of its citizens.

This being the priority to be immediately addressed urgent measures have to be taken for interim and long term relief for our suffering citizens.

The Government in power claims that it is seriously addressing the economic issues confronting the country.

There appears to be measures taken related to the IMF, import controls, levying of taxes, promises of debt restructuring which though required the processes involving some of these lack transparency if not proper planning. Fundamental to addressing the short term and long term measures to overcome the economic crisis is stability though a government which has the acceptance of the people sans corruption, without abuse of power and mismanagement.

Presently the country has a Parliament and Executive which cannot claim to enjoy the confidence of the people as events that unfolded in the last few months have demonstrated that the much trumpeted mandate through resounding victories at the Presidential and parliamentary elections of 2019 and 2020 have all but evaporated. The Executive and parliament of the day comprise persons who can only fall back on a purported constitutional mandate (without the will of the people) to govern for specified constitutional terms which claim has been gained and buttressed by credible allegations of resort to dubious transactions and maneuvering.

The peoples cry for the abolition of the Executive Presidency and setting up of a consensual all party interim government has been conveniently ignored. Such is notwithstanding clear assurances from Former President Gotabaya Rajapakse and the present incumbent. The "Government" of the day carries on its business as usual with abuse of power, dictatorial suppression through armed force of legitimate freedom of expression and other fundamental rights using draconian legislation such as the PTA which it had vowed to abolish.

The recent appointment of Thirty Eight State Ministers mostly of persons of proven dubious credentials further burdens the economy though there are claims that all of them will forgo (only) their basic wage in a country with economic woes. Such is totally unacceptable. What was envisaged was an interim cabinet of a few with well defined interim economic measures to be accomplished speedily and Parliamentary elections to be held at the earliest – no later than 12 months.

Even the much trumpeted 22nd Amendment to the constitution put forward by the present government has fallen far short of the promise by both the former and present President to abolish the 20th amendment and restore the 19th amendment with progressive improvements. Consequent to the recent determination of the Supreme Court, the powers of the Executive President have been further enhanced from what was envisaged by the original draft of the 22nd Amendment. The constitutional council itself intended to ensure independent vital institutions and processes in governance cannot be perceived as independent and is a far cry from what was provided by the 19th amendment.

The prevalent political instability which cuts through the entire social fabric will undermine any progressive steps towards economic recovery and leaves the citizens skeptical of any worthwhile measure or the will to do so by those presently in governance. There appears little choice if further deterioration of the entire country is to be avoided. Parliamentary elections and a constitutional amendment even through a referendum, seems the only option at present, if a system change is to be brought about to definitively overcome the decadent divisive, exploitative culture of the past 74 years and to see the country on a proper course.

Even at this late stage we consider it mandatory that the incumbent president comply with the wishes of the people by desisting from all acts of oppression and economic waste underlined by corruption and set in place a limited consensual cabinet of persons of integrity and capability to urgently address the economic problems with the guidance of independent experts. Such should be with a definite time frame not more than 12 months assuring early elections and if needed even through a Referendum for Constitutional Amendments to abolish the Executive Presidency and bring about a system change towards the clean governance, rule of law and equality for all.

Sign by
Collective for Reforms